**නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභාව - 2023**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි

හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ  ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන  ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුද්දර ගාස්තු වටිනාකම රු.91,861,941ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශ මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වටිනාකම රු.277,000ක් වූ වත්කම් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | එම | එම |
| (ඇ) | ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර වටිනාකම රු.6,080,384ක් වුවත් එය රු.11,263,700ක් ලෙස වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | එම | එම |
| (ඈ) | වටිනාකම රු.2,297,365ක් වූ ඉදිකිරීම් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | එම | එම |
| (ඉ) | ප්‍රාග්ධන ආධාර ගිණුමට බැර කළ යුතු රු.7,956,416ක මුදලක් හිඟ හිටි වෙනත් ආදායම් ගිණුමට බැර කර තිබුණි. | එම | එම |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.1,938,430ක් වූ ගිණුම් විෂයයන් 06ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ නිවැරදි බැවින් උප ලේඛන නිවැරදි කිරීමට කටයුතු කරන බව. | උප ලේඛන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.166,177,531ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.186,267,559ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| ---------------- | ----------- | --------- | -------- | --------- | ---------- | -------- | ------- | ------- |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 24,143 | 23,640 | 13,418 | 21,443 | 24,587 | 28,226 | 21,226 | 24,389 |
| කුලී | 31,949 | 24,369 | 21,159 | 4,955 | 29,513 | 24,956 | 22,920 | 4,159 |
| බලපත්‍ර ගාස්තු | 3,973 | 8,340 | 8,339 | 2 | 5,693 | 3,257 | 3,254 | 3,000 |
| වෙනත් ආදායම් | 161,598 | 118,626 | 117,907 | 5,934 | 33,751 | 50,490 | 50,026 | 1,006 |
| එකතුව | 221,663 | 174,975 | 160,823 | 32,334 | 93,544 | 106,929 | 97,426 | 32,554 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් රු.20,647,420ක්, අක්කර බදු රු.796,564ක් සහ කුලී රු. 4,955,098ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් උසාවි දඩ රු.71,894,229ක් හා මුද්දර ගාස්තු රු.124,497,649ක් ලැබිය යුතුව තිබුණි. | හිඟව පවතින උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | නාත්තණ්ඩිය මහජන බැංකුව අසල ප්‍රාදේශීය සභාව විසින් ඉදිකර ඇති කඩවලට අයත් භූමිය නාත්තණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ඉඩමක් වූ අතර එය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලිඛිතව දැනුවත් කර ඇති බව. | ඉඩම පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සිව් අවුරුදු සැලැස්මට ඇතුළත් කර 2023 වර්ෂයේ ඉටු කළ යුතුව පැවති ව්‍යාපෘති 109න් කිසිවක් ඉටුකර නොතිබූ අතර 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත්ව තිබුණද සිව් අවුරුදු සැලැස්මේ ඇතුළත් නොවුණු ව්‍යාපෘති 24කින් 08ක් ඉටුකර තිබුණි. | අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු පමණක් සිදු කළ බවත් එම නිසා සිව් අවුරුදු සැලැස්මේ හා ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් සියලුම ව්‍යාපෘති සිදු කිරීමට නොහැකි වු බව. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් විය යුත්තේ අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු ඒවා ඉටු කළ යුතු ප්‍රමුඛතාවය අනුව වේ. එසේම චක්‍රලේඛයෙහි දක්වා ඇත්තේද අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු පමණක් සිදු කළ යුතු බවකි. |
| (ඇ) | 2019 වර්ෂයේ නාත්තණ්ඩිය නගරයේ රථ වාහන ගාල් කිරීම හා ආහාර අලෙවි සැලක් ඉදිකිරීම සඳහා සභාව විසින් රු.7,804,830ක් වැයකර තිබුණි. ඒහෙත් ඒ සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ අවසරය ලබාගෙන නොතිබුණු බැවින් ඉදිකිරීම් ඉවත් කිරීමේ අවධානමක් පැවතුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | අවශ්‍ය අනුමැතීන් ලබාගෙන ඉතා සුපරික්ෂාකාරීව රජයේ අරමුදල් යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මුදුකටුව ප්‍රදේශයේ දරුවන්ගේ දැනුම හා අධ්‍යාපන කටයුතු පහසු කිරීමේ අරමුණින් 2021 වර්ෂයේ රු.1,377,215ක මුදලක් වැයකර මුදුකටුව කියවීම් ශාලාව ඉදිකර තිබුණි. | | |
| (i) | ප්‍රදේශයේ දරුවන්ගේ දැනුම හා අධ්‍යාපන කටයුතු පහසු කිරීමේ අරමුණින් කියවීම් ශාලාව ඉදිකළද එය දරුවන් විසින් භාවිතයට ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | රජයේ අරමුදල් භාවිතා කිරීමේදී එම අරමුදල් ඵලදායීව යෙදවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | මෙහි III වන අදියර ලෙස ඉහළ මහලේ ඉතිරි වැඩ කොටස් නිම කිරීම සඳහා රු.934,416ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද එම කර්මාන්තය ඉටුකර නොතිබූ අතර එම මහලේ කණු 04 ඉදිකර වහළය පමණක් සවිකර තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | එම |
| (ඉ) | මට්ටකොටුව ක්‍රීඩාංගනය වටා වැට සැකසීම සඳහා 2018 වර්ෂයේ සභා අරමුදලින් රු.375,625ක් වැය කර තිබූ අතර භෞතික පරීක්ෂාවේදී එම ක්‍රීඩාංගනය හා වැට කැලෑවෙන් වැසී තිබුණි. | මේ වනවිට මෙම ක්‍රිඩා භූමිය ශුද්ධ පවිත්‍ර කර ඇති බව. | රජයේ අරමුදල් වැය කර ඉදිකරන ලද භෞතික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුය. |
| (ඊ) | 2019 වර්ෂයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ CCTV කැමරා පද්ධතියක් සවි කිරීම සඳහා සභා අරමුදලින් රු.348,290ක් වැයකර තිබූ අතර එම කැමරා පද්ධතිය අක්‍රිය වීමෙන් පසුව අළුත්වැඩියාව සඳහා යොමු කළ බව දැක්වෙතත් ඒය කුමන ආයතනයකට කවදා යොමු කළාද යන්න පිළිබඳවත් සභාව තුළ කිසිදු තොරතුරක් නොතිබුණි. | කැමරාව අලුත්වැඩියා කර සවිකිරීමට කටයුතු කරන බව. | කැමරා පද්ධතිය අළුත්වැඩියා කර සවි කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | 2013 අංක 01 දරණ ප්‍රජා මූල සංවිධාන (ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක) ස්ථාපිත කිරීමේ හා විධිමත් කිරීමේ ප්‍රඥප්තිය අනුව හඳුනාගන්නා ලද ප්‍රජාමූල සංවිධාන 06ක් ලියාපදිංචි කරවීමට කටයුතු කර නොතිබූ අතර ප්‍රජා මූල සංවිධානවල විවිධ අක්‍රමිකතාවයන් සහ ගැටළු අධීක්ෂණය කර නොතිබුණි. | 2024 වසරේදී සියලුම ප්‍රජාමූල ව්‍යාපෘති ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ඒකකයේ ලියාපදිංචි කර වීමටත් විධිමත්ව අධීක්ෂණය කිරීමටත් කටයුතු සිදු කරන බව. | ප්‍රජා මූල සංවිධාන වාර්ෂික බලපත්‍ර ලබා ගැනීම සඳහා යොමු කළ යුතුය. |
| (ඌ) | 2023 වර්ෂය සඳහා කර්මාන්ත වර්ග 15කට අදාළව පරිසර බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාර 31ක 2023 ජූනි 30 දින වන විට රු.75,625ක හිඟ ශේෂයක් වූ අතර සභාවේ පරිසර නියාමන වගකීමද පැහැරහැර තිබුණි. | බලපත්‍ර ලබා ගන්නා ලෙස ලිඛිතව දැනුවත් කර ඇති බව. | පරිසර බලපත්‍ර ලබා ගැනීමට ව්‍යාපාර ආයතන දැනුවත් කළ යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ වටිනාකම රු.47,626,034ක් වූ අතර ඒ | ලැබීමට ඇති හිග මුදල් අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තුළ අවුරුදු 03 ඉක්ම වූ රු.18,669,586ක ශේෂයක්ද විය. | | |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ වටිනාකම රු.57,514,467ක් විය. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ණයහිමියන් කඩිනමින් පියවීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 5කට වරක් වරිපනම් ප්‍රතිශෝධනයක් කළ යුතු වුවත් 2010 වර්ෂයේ සිදු කරන ලද වරිපනම් තක්සේරුව මත 2023 වර්ෂයේද වරිපනම් අයකර තිබුණි. | නව තක්සේරු වාර්තාව ලැබූ විගස එම වාර්තාවට අනුව වරිපනම් මුදල් අය කරන බව. | වරිපනම් තක්සේරු කර අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2019 ජනවාරි 10 වන දින චක්‍රලේඛ අංක 2019/01 හි 03 වගන්තියට පටහැනිව වලහපිටිය පාර පාරු ඇළ අසළ කඩ කාමර බදුකරුගේ ඉල්ලීම පරිදි වර්ෂ 03කට බදු දී තිබුණි. | බදුකරු පිළිකා රෝගී තත්වයකට මුහුණ පා ඇති බැවින් ටෙන්ඩර් කිරීමකින් තොරව 2023 වර්ෂය සඳහා සියයට 10 ගාස්තු වැඩි කිරීමක් සිදුකර බදු ලබා දුන් බව. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් වත්කම බදු දීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | නාත්තණ්ඩිය සුපිරි වෙළඳ සංකීර්ණයේ උඩු මහලේ ශාලාව ටෙන්ඩර් කැඳවීමකින් තොරව 2022 වර්ෂය සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටු තීරණයක් මතද 2023 වර්ෂය සඳහා මහ සභා යෝජනාවක් මතද රු.88,000කට බදු දී තිබුණි. | ඉදිරි වර්ෂ සඳහා ටෙන්ඩර් කර බදු ලබා දීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් වත්කම බදු දීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2021 ජුලි 08 දිනැති 2235/54 අංක දරන ගැසට් පත්‍රය ප්‍රකාරව ජාතික රාජ්‍ය සභාවේ අංක 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ II කොටසේ 24 ඡේදයේ II ප්‍රකාරව අනුබෙදුම් කරන ලද ඉඩමේ සියයට 10ක ප්‍රමාණයේ වෙළඳපල වටිනාකම සුදුසුකම්ලත් තක්සේරුකරුවෙකුගෙන් ලබාගත යුතු බව දක්වා තිබුණත් එයට පටහැනිව 2021, 2022 වර්ෂ 02කේදී ඉඩම් කොටස් 05ක් සඳහා ආදායම් පරීක්ෂක තක්සේරුව මත රු.3,693,660ක් අයකර තිබුණි. | මේ වන විට කට්ටි කරන ලද ඉඩමෙහි සියයට 10 කොටසට අදාල මුදල අයකර ගැනීම සඳහා තක්සේරු ලබා ගැනීමට පිළිගත් තක්සේරුකරුවන් වෙත ඉදිරිපත් කරන බව. | ගැසට් පත්‍රය අනුව කටයුතු කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තියට අනුව සුසාන භූමි හා මිනී පිටි ආඥා පනතේ 03 වන වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයට අයත් සේ සැලකෙන සුසාන භූමි 15ක් සභාව වෙත පවරාගෙන නොතිබුණි. | ඉදිරියේදී පවරා ගැනීමට කටයුතු කරන බව. | අදාළ දේපළවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | අනවසර ඉදිකිරීම් සඳහා පනවන දඩ මුදල් රැස් කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සහ සභාව විසින් පවත්වාගෙන යන ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය රු.2,157,322ක් වන අතර එය ඵලදායී සංවර්ධන කටයුත්තක් සඳහා යොදා ගෙන නොතිබුණි. | මෙම ගිණුමේ ඇති මුදල් පරිහරණය සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් අනුමැතිය ලබා ගැනීමට වරින් වර ලිඛිත ඉල්ලීම් කළත් මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිචාරයක් නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබා දී නොමැති බව. | ඵලදායී කුමන කටයුත්තක හෝ අරමුදල් යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ඉඩම් කට්ටි කිරීමේදී සභාවට පවරා ගන්නා ලද ඉඩම්වලින් ඉඩම් 21ක ඵලදාව බදුදීමට හෝ ඵලදායී කටයුත්තක යෙදවීමට කටයුතු කර නොතිබුණි. | කිසිදු බදු කරුවෙක් ඉදිරිපත් නොවීම හේතුවෙන් බදු දීමට නොහැකි වී ඇති අතර ඵලදාව නෙලීමේ කටයුතු සභාව මගින් සිදු කරන බව. | වත්කම්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට සභාවේ තෘතියික ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 02ක්ද, ද්විතියික ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු 15ක්ද, ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 43ක්ද පැවතුණි. | අනුමත තනතුරු සඳහා බඳවා ගැනීමට ඉල්ලීම් කර ඇතත් මේ දක්වා පිළිතුරු ලැබී නොමැති බව. | සභාවට අවශ්‍ය සේවක සංඛ්‍යාව නිවැරදිව හඳුනාගෙන අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සේවය හැර ගිය, වැඩ තහනම් කල හා ස්ථාන මාරු වී ගිය සේවකයින් 26 දෙනෙකුගෙන් රු.96,058ක අයවිය යුතු ශේෂයක් විය. | අයකර ගැනීමට හැකියාවත් නොමැති බව. | අයවිය යුතු සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 වාහන පද්ධති කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| 2022 පෙබරවාරි 08 දින PF-7478 දරන කැබ් රථය හදිසි අනතුරකට ලක් වී තිබූ අතර ඊට අදාළව මු.රෙ. 104(3) යටතේ අලාභයන් පිළිබඳ ප්‍රාරම්භක වාර්තාව 2022 පෙබරවාරි 09 නිකුත් කර තිබුණද මු.රෙ.104(4) ප්‍රකාරව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | වාර්තාව ලැබූ විගස මුරෙ 104) (04) අනුව පූර්ණ වාර්තාව ඉදිරිපත් කරන බව. | මු.රෙ. ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම හා එහි කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා සහාය වන ක්‍රියාවලියක් වූ නමුත් සභාවේ අභ්‍යන්තර විගණනය විසින් අවධානය යොමු කර තිබුණේ ආදායම් රැස් කිරීම, පැමිනීමේ ලේඛන පරීක්ෂාව, දීමනා ගෙවීම් පරීක්ෂාව, ගබඩා පරීක්ෂාව පිළිබඳව පමණි. | 2022 වර්ෂය තුල අභ්‍යන්තර විගණනයේ පැවති දුර්වලතා මග හරවා ගනිමින් අභ්‍යන්තර විගණනය ශක්තිමත් කරමින් කටයුතු කරන බව. | ආයතනයේ සියළුම කටයුතු ආවරණය වන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුය. |

**4.2 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| වැය ශීර්ෂ 94කට අදාළව රු.33,266,340ක් වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදනය කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ එම සම්පූර්ණ ප්‍රතිපාදනයම අදාළ අරමුණු ලබා කර ගැනීම සඳහා භාවිතා කර නොතිබුණි. | ඉදිරිපත් කර ඇති කරුණු සමග එකග වන බව. | අයවැය ගත ඉලක්ක සපුරා ගැනීමට හැකි අයුරින් මෙහෙයුම් කටයුතු සැලසුම් කළ යුතුය. |

**4.3 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු 08ක් හඳුනාගෙන එම අරමුණු ළඟා කර ගැනීමේ වැඩසටහන් 68ක් 2023 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. එම ක්‍රියාකාරකම් 53ක ප්‍රගතිය සියයට 50ට වඩා අඩු මට්ටමක පැවතුණි. | වාර්ෂික සැලැස්මට ඇතුලත් කර ඇති සංවර්ධන ව්‍යාපෘති තාවකාලින නවත්වන ලෙසට ලබා දුන් චක්‍රලේඛ උපදෙස් මත තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා හඳුනාගෙන තිබු සංවර්ධන යෝජනා සිදු කිරීමට නොහැකි වූ බව. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟා වීමට කටයුතු කල යුතුය. |